



## බ්‍රිතාන්‍ය ජාතිකයෙකුගේ විමසුම් ඇසට ලක්වූ යටත් විජිත ලංකාව

ලංකාවේ මහා පාවා දීම ලෙස සැලකෙන උඩරට ගිවිසුම මගින් උඩරට රාජධානිය බ්‍රිතාන්‍යයට ලියා පවරා දීම සිදුවී වසර 191ක් ගත වී ඇති මේ මොහොතේ 19වන සියවසේ ලංකාවේ පැවති සංස්කෘතික පසුබිම බ්‍රිතාන්‍ය ජාතිකයෙකුගේ ඇසට ලක්වී ඇති අයුරු විමසා බැලීමේ යම් වැදගත් කමක් ඇතැයි සිතමු. මෙතැන් සිට කොටස් වශයෙන් ඔබ වෙත ගෙන එන්නට බලාපොරොත්තු වන්නේ 1892 දී ලියා පල කරන ලද ඇලන් වෝල්ටර්ස් ගේ පාම්ස් ඇන්ඩ් පර්ල්ස් නම් වූ කෘතිය ඇසුරෙන් සකස් කළ ලිපි පෙළකි.


KANDY LAKE FROM THE TEMPLE OF THE SACRED TOOTH.

# තල් පොල් සහ මුතු පබා

**ශ්‍රියා කුමාරසිංහ** *නවසීලන්තයේ සිට*

*(නවසීලන්තයේ ඔතාගෝ විශ්ව විද්‍යාලයයේ පර්යේෂණ කටයුතු වල නියැලී සිටින ශ්‍රියා කුමාරසිංහ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ හිටපු ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වරියකි. ඈ සිය ආචාර්ය උපාධිය හදාරන්නේ ජපානයේ ත්සුකුබා විශ්ව විද්‍යාලයයේ ය)*

## හැඳින්වීම

*යමෙකු මෙසේ කියා තිබුණි.*

ලංකාව වනාහී නොයා යුතු තැනකි. අප්‍රසන්න කුඩැල්ලන්, විසකුරු නාගයින්, පිළිකුල් සහගත කෘමීන්, ගොදුරු ගිලින කිඹුලන් සහ ලේ පිපාසිත මෝරුන් විසින් ගොඩ බිමත් මුහුදත් එක සේ ජීවිතය පීඩාකාරී කරවනු ලබත්. අවුරුද්දේ මාස තුනක් ඔබ උදුනක දැවේ. ඉතිරි මාස නවය පුරා රෙදි සායම් කවන කල්දේරමකින් පිටවන හුමාලය බඳු වාතාවරණයක කල් ගෙවීමට සිදුවේ. දිවා ආහාරය සඳහා බත් සහ මාළු පිණිද, රාත්‍රී කෑමට මාළු පිණි සහ බත්ද ලැබේ. ස්වදේශිකයින් වංචා කරති. දෙවියන් නොඅදහති. යකුන් උදෙසා පුද පූජා පවත්වති. අද ඔබ මිතුරෙකු සමග කෑම ගනු ඇත. හෙට ඔබට ඔහු වළ දැමීමට සිදුවේ. මෝඩයෙකු හැර අන් කිසිවෙකු ලංකාවේ ජීවත් වීමට නොපෙළඹෙනු ඇත.

තවත් අයෙක් මෙසේ කියා ඇත. ලංකාව යනු මිහි පිට පාරාදීසයකි. මහම-දිකයින් සහතික කොට පවසන්නාක් මෙන් දෙව් ලොවට ඇත්තේ තව සැතපුම් හතලිහක දුරකි. ඇත්තෙන්ම එම දුර ඊටත් වඩා කෙටි වී ඇත්තාක් මෙනි. සැතපුම් සිය ගණන් දුරට විහිදී ගිය, දසත සුවඳ හමන මලින් හා නැවුම් රතු පැහැති ගෙඩි වලින් පිරුණු කෝපි යායවල්, අක්කර දහස් ගණන් පුරා පැතිරී ගිය ඉතා ප්‍රනීත තේ, මිනිසා අපේක්ෂා කරන පරිද්දෙන්ම අංශක 60 සිට 140 අතර වු සියළු දේශ ගුණික තත්වයන්, මනස්කාන්ත ස්වභාවික දසුන් හා වනාන්තර, විසිතුරු මල්දම් බඳු ලිය වැල්, සුවඳැති කුඩා පඳුරු, ඉතා අලංකාර මල්, දිදුලන වර්ණවත් කුරුල්ලන් ගෙන් හා සමනලුන්ගෙන් ශෝභාමත් වු එළිමහන් පිටි, රන්මිණි බරණින් සැරසුණු ගංගා, වටිනාකමින් අගනා මුතු ඇතිරුණු වෙරළතීරය, සොඳුරු රාත්‍රිය, එකම මනරම් සිහිනයක් බඳු වූ ගෙවී යන දවස්, කපටි-කමින් තොර කරුණාවන්ත මිනිසුන් ආදී සියල්ලෙන් පිරීපුන් මේ බිමේ දී ඔබ කිසිවකින් නොඅඩු සැප සම්පත්වල හිමි කරුවෙකි.

සාමාන්‍යයෙන් සිදු වන පරිදිම සැබෑ සත්‍යය මේ අන්ත දෙක අතර පවතී. එහෙයින් මගේ අරමුණ වන්නේ මෙය කියවන පාඨකයාට ඉහත කී අන්ත දෙක අතර පහසුවෙන් සැරිසැරීමට හැකිවන අයුරින් ලංකාව පිළිබඳ සරල විස්තරයක් ගෙන ඒමත්, එම දූපතේදී මගේ ජීවිතයට එකතු වූ ඉතා මිහිරී මතක සටහන් මගින් දූපත ආශ්‍රිත විස්මයන් පිළිබඳව පාඨකයා තුල යම් මතයක් ගොඩ නැගීමත්ය.

මුලින්ම දේශගුණය ගනිමු. සාමාන්‍යයෙන් එංගලන්තයේ මහ රැජිණට අයිති විජිතයන්හි වැඩිම උෂ්ණත්වයක් ඇති නගරය කොළඹ බව කියති. කොළඹට පා තබන සංචාරකයෙක් ගොඩනැගිලිවල දුම් කවුළු නැති බව දැක පුදුම නොවීම එතරම් අරුමයක් නොවේ. මන්ද යත් නගරයේ සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය ෆැරන්හයිට් 81ක් පමණ වන හෙයිනි. සාමාන්‍ය වර්ෂාපතනය අඟල් 95ක් පමණ වේ. එය සැන්සිබාර් හි වර්ෂාපතනයෙන් අඩකි. ලන්ඩනය මෙන් හතර ගුණයකි. කොළඹට වඩා සෑහෙන වැඩි වර්ෂාපතනයක් නුවරට ලැබේ. ත්‍රිකුණාමලයට සහ නැගෙනහිර වෙරලබඩ ප්‍රදේශයට වැස්ස ලැබෙන්නේ තවත් අඩුවෙනි. එමෙන්ම මලබාර්' වෙරල තීරයේ සැතපුම් කිහිපයක් වයඹ දිගට යන විට ඇත්තේ පැය විසි හතරක් තුල අඟල් 14ක වැස්සක් ලැබෙන ප්‍රදේශයක් බවද නොදන්නා කරුණක් නොවේ. අප්‍රේල් සහ මැයි කොළඹ උෂ්ණත්වය අධිකම මාස වන අතර දෙසැම්බර් සහ ජනවාරි වඩාත් සිසිල්තම මාසයන් වේ. ලංකාවේ මුහුදුබඩ සහ පහත් බිම් පලාත් වල ඇති දේශ ගුණය කිසියම් සුවිශේෂ කායික ශක්තියක් ඇතිකිරීමට තරම් සරු නොවන බව නම් පිලිගත යුතුය. දවස් හතේම ඔහේ කුසීතව දිග ඇදී නිදන කුම්බකර්ණයන් කොට්ඨාශයක් සිටිතැයි ඒත්තු ගැනෙන පරිදි කාලයකට අහසත්, පොලොවත්, මහ මුහුදත් කිසියම් සියුම්, සංවේදී නිසලතාවයක ගැලී පවතී. පිරිසිදු නිල් මැණික් පැහැය ගත් මහ මුහුද පෙනෙන්නට තිබෙන සියළු දෑ ඔප දැමූ රන් පැහැයෙන් නහවමින් බැබලෙන හිරු එළියට යටින් දිළිසෙයි. මුහුදු රළ ද ධීවරයින් ගේ හබල් ඔරු පැද්දීමට හෝ මුහුදට නැවී ඇති පොල් රුප්පාව හා මලින් හැඩ ගැන්වුනු තණ බිස්ස මුහුදින් වෙන් කොට වැටී ඇති කහ පැහැති වැලි තීරුවේ හිම බඳු සුදු පෙණ විසිරීමට හෝ සවි බල නැතුවාක් මෙනි. නොගැඹුරු මුහු-දේ දිය මත පතිත වන ආලෝක කිරණ රන්වන් වැලි තලයේ ගැටී නිල්වන් පසුබි-මක මනස්කාන්ත දසුනක් මවයි.

ගෝලාකාර වු පැහැදිලි අහස පහතින් ඇති ලෝකය මත උණුසුම් ආලෝකයක් පතුරුවා හරිමින් මේ සියළු සොබා සුන්දරත්වයන් එකට මුසුවී සරාගී සිහිනයක ගිලී ඇති සෙයක් මවයි. නැතහොත් ඒ සියල්ල සුමුදු සේල පටලයක් බඳු වූ වායු ගෝලයෙන් ඔතා උදාසීන කොට ඇත්තාක් මෙන් දිස්වේ.

සමකය ආශ්‍රිත වෙනත් ගොඩ බිම් වල මෙන් ලංකාවේද ආලෝකය ඉතා දැඩිය. එමගින් අවට ඇති දේවල් ඉතා තියුණු ලෙස මතුකොට පෙන්වයි. එසේ නැතහොත් ගැහෙමින් එළිය විහිදුවන දීප්තිමත් දැල්ලක් සේ බොඳ වී පෙනෙයි. නෝර්වේ හි කඳු බෑවුම් වල ඇති පටු මුහුදු තීරයේ හෝ ස්කොට්ලන්තයේ කඳුකරයේ හෝ දක්නට ලැබෙන්නාවු මුදු පසුතල හා තද පැහැති වර්ණ මෙහි දක්නට නොලැබේ. නිවර්තනීය සුන්දරත්වය යනු උත්කර්ෂණයක් නැති සුන්දරත්වයකි. මනස තුල අළුත් සිතිවිලි මෝදු වීමට හෝ සිතිවිලි උල්පත් පහල වීමට ඇවැසි ශක්තිය ජනනය කිරීමට පොළඹවන්නාක් මෙන් පෙනෙන සියල්ල සිනාසී සිටී. සෑම අතින්ම නැගී එන එම පෙළඹවීමට ඇති එකම බාධාව නම් අප්‍රසන්න වූ දැඩි උෂ්ණත්වයයි. එමෙන්ම එම උෂ්ණත්වයේ ඇති එලවළු වලට හිතකර එහෙත් සත්ව ජීවිතයට පැහැදිලි ලෙසම හානිකර වූ අසාමාන්‍ය කාබනික සංයුතියයි.

මා පළමු වරට මෙම නිවර්තන කලාපීය බිමට පා තැබූ මුල් දින වල ආලෝකයත්, උෂ්ණත්වයත්, මල් ලෝකයේ සුන්දරත්වයත් විඳිමින් අතිශයින් ප්‍රීති වු හැටි මට හොඳින් මතකය. නමුත් ටික කලකින් එම හැඟීම දිය වී ගියේය. එම දැකුම්කළු මල් පො-හොට්ටු වල හා මල් හට ගන්නා ගස්වල ඉතා අභිමානවත් වූ කිසියම් දෙයක් ගැබ් වී තිබුණි. මම බ්ලූබෙල් හෝ ප්‍රිම්රෝස් හෝ ෆොගෙට් මී නොට් මලක් දැකීමේ ආශාවෙන් පෙළෙන්නට වීමි. මෙහි ඇති කිසිම මලක හෝ තුරු ලතාවක ඉංග්‍රීසි සිසිරයක අයුරුවක් හෝ දැවටී නැත. දළු සහ රන්වන් පැහැති ඩැෆඩිල් නැත. වෙඬරු තැටියක ඇති කාන්තිය නැත. වසන්තයේ දිදුලන අයිරිස් ගස් නැත. වසන්තය හැඩ ගන්වමින් තැන තැන එබී බලන කහ, සුදු, දම් පැහැති කුඩා මල් නැත. මෙහි ඇත්තේ පියකරු දසුනක් වුවද එතුල ඇත්තේ කෙනෙකු පුදුමාකාර ලෙස අසංතෘප්ත කරන සදාකාලික ඒකාකාරී බවකි. වසර පුරා සුළු වශයෙන් මල් පුබ-දුවන නානා වර්ග වල සදාහරිත ගහකොළ අතර නැවුම් බවේ ආකර්ෂණය සිඳී ගොස් ඇත. සත්තකින්ම මෙහි ඇති ඇස් ගිණිකර වැටෙන සුන්දරත්වය පිළිබඳව නිවර්තනයට පුරසාරම් දෙඩිය හැකිය. නමුත් ලංකාවේ හෝ ෆිජි දූපතක සිටින ඉංග්‍රීසි ජාතිකයෙකු සියරට පැරණි ගෙවත්තේ ඇති මලක සුවඳ සිහි ගන්වන බිත්ති ආවරණයකට ලොල් නොවනු ඇත. කවුරු කෙසේ කීවත් ඉංග්‍රීසි මල් වල මෙයිට වඩා සමාජශීලී ගතියක් ඇත.

ලේඛකයා පළමු වරට දුටු කොළඹ නගරයේ විස්තර ඇතුළු තවත් කොටසක් ලබන කලාපයෙන් කියවමු.

■